**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව - 2022**
**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු.13,853,282ක් වූ සභාව සතු ඉඩම් 03ක්, ගොඩනැගිලි 06ක් හා රු.2,730,527ක වෙනත් වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා හිඟහිටි බහුකාර්යය ගොඩනැගිලි කුලිය රු.140,000ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර බෙලිහුල්ඔය සංචාරක ගිමන් හල සඳහා ලැබිය යුතු කුලී රු.781,150ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා දෝෂ සහගතව ද්විත්ව සටහන් තැබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත අරමුදල රු.1,427,854ක් වැඩියෙන් දැක්වුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | ගිණුම් විෂයයන් 07ක සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු. 10,800,813ක වෙනසක් විය. | නොසැසඳීම් හඳුනාගෙන ශේෂ තුලනය කිරීමට මේ වන විටත් කටයුතු කරමින් පවතින බව. | වෙනස නිරවුල් කළ යුතු වේ. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.113,902,104ක් වූ ගිණුම් විෂයයන් 05ක් තහවුරු කර ගැනීමට විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොවුණි. | අදාළ උපලේඛන 2023 වර්ෂයේ ගිණුමට ඉදිරිපත් කරන බව. | විස්තරාත්මක උපලේඛන ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ (අ) සහ (ආ) උපවගන්ති පරිදි සභාව සතු මාර්ග හඳුනාගෙන ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. | 2023 මැයි මාසය වන විට මාර්ග ගැසට් ලේඛනය නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,147,407ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,168,196ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,908,337 | 859,515 | 863,702 | 160,622 | 909,308 | 856,868 | 811,964 | 271,401 |
| කුලී | 4,375,480 | 3,211,450 | 2,744,860 | 493,180 | 3,665,080 | 1,749,230 | 1,749,230 | - |
| බලපත්‍ර ගාස්තු | 1,831,000 | 588,026 | 588,026 | - | 1,831,000 | 446,825 | 446,825 | - |
| වෙනත් ආදායම් | 12,706,800 | 10,008,078 | 52,318,480 | 8,721,859 | 10,326,000 | 9,844,874 | 8,401,638 | 26,050,122 |
| | 21,821,617 | 14,667,069 | 56,515,068 | 9,375,661 | 16,731,388 | 12,897,797 | 11,409,657 | 26,321,523 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් දේපළ වසර 05කට වරක් තක්සේරු කළයුතු වුවත්, 2011 වර්ෂයෙන් පසු තක්සේරුවක් සිදුකර නොතිබුණි. එමෙන්ම, 2018 වර්ෂයේදී හඳුනාගත් සංවර්ධිත ප්‍රදේශවලින් වරිපනම් බදු අයකර නොතිබුණි. | සංවර්ධිත ලෙස හඳුනාගත් ප්‍රදේශවල වරිපනම් ඒකක හඳුනාගැනීමේ කටයුතු 2022 වර්ෂයේ දි අවසන් කළ අතර වරිපනම් තක්සේරුව සඳහා ඉදිරි කටයුතු සිදු කරන බව. | ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ජල ව්‍යාපෘති 10කින් වර්ෂ 01කට වඩා පැරණි රු.8,122,689ක් ද, වසර 03කට වඩා පැරණි අක්කර බදු රු.100,285ක් ද, JCB යන්ත්‍රය කුළියට දීම වෙනුවෙන් රු.610,840ක් ද, අයකර නොතිබුණි. එමෙන්ම, JCB යන්ත්‍රය බැහැර වැඩට | හිඟ මුදල් අයකරගැනීමට කටයුතු කෙරේ. 2023 වර්ෂයේදී යන්ත්‍ර පැයක ඇස්තමේන්තු මුදල සංශෝධනය කර ගැසට් කිරීමේ කටයුතු සිදු කරන බව . | හිඟ ආදායම් අප්‍රමාදව අයකරගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ගාස්තු රහිතව ලබා දීම නිසා රු.179,550ක ආදායමක් අහිමි වී තිබුණු අතර නිර්දේශිත ගාස්තුවට පටහැනිව, ගාස්තු අයකිරීම නිසා රු.126,335ක ආදායමක් ද අහිමි වී තිබුණි. | | |
| (ඇ) | බෙලිහුල්ඔය සංචාරක ගිමන්හල සඳහා 2021 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා අයවිය යුතු රු.413,550ක් විෂයය භාර අමාත්‍යවරයාගේ/ ආණ්ඩුකාරවර අනුමැතිය ලබා නොගෙන කපාහැර තිබුණි. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරන බව. | ආණ්ඩුකාරවර අනුමැතිය ලබාගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිරාපත් නොවන කසළ විශාල ප්‍රමාණයක් පරිසරයට අහිතකර වන ලෙස බැහැර කර තිබුණි. නොදිරන කසළ මධ්‍යස්ථානයක් සඳහා 2022 ජූනි මාසයේ ලද රු.950,000ක් වූ බෙලර් යන්ත්‍රය, 2022 දෙසැම්බර් වන විටත් අභාවිතව පැවැතිණි. | ඉදිරියේදී නොදිරන කසළ අංගනයක් ඉදිකිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර අදාළ අංශ වෙත යොමු කර ඇති බව | අවශ්‍ය පහසුකම් ලබාගෙන යන්ත්‍රය උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2002 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලයට අදාළ හඳුනා නොගත් අත්තිකාරම් රු.3,193,731ක් කපාහැරීම සඳහා ආණ්ඩුකාරවර අනුමැතියට යොමුකර තිබුණි. එමෙන්ම, 2010 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා නිකුත් කර තිබුණු රු.1,072,697ක් වූ අත්තිකාරම් 10ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් පියවා නොතිබුණි. | එම ශේෂ කපා හැරීම සඳහා ආණ්ඩුකාරවර අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පහන්තුඩාව ඇල්ල අසල රු.1,852,279කින් නිමකළ වැසිකිළි පද්ධතිය සහිත භූමිය සභාව වෙත පවරා ගෙන නොතිබුණු අතර සභාව සතු සුසාන භූමි 133ක අයිතිය ද නිරවුල් කරගෙන නොතිබුණි. මේ නිසා එම ඉඩම් අනවසර අත්පත්කර ගැනීම්වලට ලක්වීමේ අවදානමක් පැවැතිණි. | එම බිම් කොටස සභාව වෙත පවරා දෙන ලෙස අදාළ ආයතනය වෙත ඉල්ලීම් කර ඇති බව. | අදාළ බිම් කොටස පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) සභාව සතු ඉඩම් 24ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු ඉඩම් තක්සේරු කර ගැනීම සඳහා ලිපි මඟින් තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව. | ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිය පහස ගිමන්හල 2022 නොවැම්බර් 01 දින සිට ඉදිරි මාස 08ක කාලයක් පවත්වාගෙන යාම, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හා ගිවිසුම්ගත වීමකින් තොරව පූර්ව බදුකරු වෙතම ලබා දී තිබුණි. | බදු දීම සඳහා මහ සභාව ගත් තීරණය ආණ්ඩුකාරවර අනුමැතියට යොමු කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කැපොක්වත්ත කොම්පෝස්ට් අංගනයේ රැඳවුම් බැම්ම ඉදිකිරීමේදී රු.51,290ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල රැඳවුම් මුදලින් අඩු කරන බව. | වැඩිපුර ගෙවා ඇති මුදල අඩු කළ යුතු වේ. |

**3.6 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2011 වර්ෂයේ දී සභාවට ලද රු.1,550,000ක් වූ ගලි බවුසරය, ලද දින සිට නිෂ්කාර්යව පවතී. | අපද්‍රව්‍ය බැහැර කිරීමට ස්ථානයක් නොමැති නිසා එය වෙනත් පළාත් පාලන ආයතනයකට ලබා දීමට කටයුතු කරන බව. | අවශ්‍යතාව ඇති ආයතනයකට එය පැවැරිය යුතු වේ. |
| (ආ) අයිතිය සභාව සතු නොවූ ට්‍රැක්ටර් 05ක හා ටේලර 04ක අයිතිය පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණු අතර අබලි වාහනයක් අපහරණය කර නොතිබුණි. | එම වත්කම් පවරා ගැනීමට කටයුතු කරන බව හා ගර්භිත කැබ් රථය සබරගමුව පළාත් සභාවට අයත් රථයක් බැවින් ඒ වෙනුවෙන් ප්‍රධාන ලේකම් වෙත ලිපි යොමු කර ඇති බව. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වේ. |